# භික්ෂූන්ට ආසන පනවා දන් පූදා දෙව්ලොව දී රන් ආසන සහ බබළන සිරුරක් ලබන්න

## පඨමපීඨ විමානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, විමානවත්ථුපාළි, පීඨ වර්ගය - පිටු අංක 2 - 3)

පෙර භවයේ මිනිස් ලොව විසූ මනුෂ්‍යයෙක් ආගන්තුක භික්ෂුවකට වැඩ හිඳින්නට ආසනයක් පිරිනමා, ගෞරව දක්වා, වැඳ, පහන් සිතින් දානය පූජා කළා. ඒ පිනෙන් දෙව්ලොව මහා සම්පත් ඇති දෙව් දුවක් ව ඉපදුණා. අලංකාර දිව්‍ය සළු හා මල් මාලා ලැබුණා. සිතෙහි වේගයෙන් ගමන් කළ හැකි රන් ආසනයක් ලැබූ ඇය, වලාකුළු තුළින් දිලිසෙන විදුලිය සේ බැබළුණා.